# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල. ☎ 011 279 7400
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla. 011 286 4051


මගේ අංකය / எனது இல / My No. }   ඔබේ අංකය / உமது இல / Your No }   දිනය / திகதி / Date } 2021. 02. 09

චක්‍රලේඛ අංකය : 2021/01

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

සියළුම ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්

සියළුම සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)

## ඉඩම් නොමැති රණවිරුවන්ගේ පදිංචිය සඳහා රජයේ ඉඩම් ලබා දීම

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය වෙනුවෙන් ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී දිවි පිදූ, අතුරුදන් වූ, පූර්ණ ආබාධිත වූ හා අර්ධ ආබාධිත වූ, විශ්‍රාම ගොස් සිටින සහ දැනට සේවයේ සිටින ත්‍රිවිධ හමුදාවේ, පොලිස් දෙපාර්තමේන්තුවේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් සහ ඔවුන්ගේ යැපෙන්නන් රැක බලා ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව විවිධ සුභසාධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති අතර ඔවුනට පූර්ව අමාත්‍ය මණ්ඩල තීරණ මගින් පදිංචිය සඳහා සහනදායී ක්‍රමවේදයක් තුළ රජයේ ඉඩම් කොටසක් ලබා දීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය.

02. රණවිරුවන් වෙත රජයේ ඉඩම් බැහැර කිරීමේ වර්තමාන ප්‍රතිපත්තිය ලෙසින් ක්‍රියාත්මක වනුයේ 2016.07.18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ඉදිරිපත් කරන ලද සහනදායී ක්‍රමවේදයයි. මෙමගින් රණවිරුවන් වෙත රජයේ ඉඩම් බැහැර කිරීමට අදාළව 2002.12.26 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබා දී ඇති අනුමැතිය සංශෝධනය වී ඇති බැවින් හා 2016.07.18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ (අ) IV අනුව 2016.08.30 දිනට පෙර රජයේ ඉඩම් දීර්ඝකාලීනව බදු ක්‍රමයට ලබාදුන් බදුකරුවන් වෙත රණවිරු පදනම යටතේ සහන ලබාදීම ප්‍රායෝගිකව ගැටළුකාරී විය. එබැවින්, මෙම තත්ත්වය තුළ එකම රණවිරු කාණ්ඩයන් වෙත සහන ලබාදීමේ දී අසමානතාවයන් පවතින බැවින්, එම අසමානතාවයන් මගහරවා ගනිමින් රණවිරුවන් හා ඔවුන්ගෙන් යැපෙන්නන් වෙත සහනදායී ක්‍රමවේදය යටතේ පදිංචිය සඳහා ඉඩම් කොටසක් ලබා දීම සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමප/20/1616/322/003 හා 2020.10.13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට 2020.11.17 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී ඇත.

03. එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, රණවිරුවන් සඳහා ඉඩම් ලබා දීමේ දී අනුගමනය කළ යුතු සහනදායී ක්‍රමවේදය පිළිබඳ උපදෙස් ලබා දීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.


☎ 011 279 7479 | 011 287 3033 | ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 | 011 286 4462 | ඉඩම් I / காணி I / Land I ☎ 011 287 4025 | 011 288 3812 | ඉඩම් II / காணி II / Land II ☎ 011 287 5834 | 011 287 3110 | ඉඩම් III / காணி III / Land III ☎ 011 279 7482 | 011 288 3635

ඊමේල් / ஈ-மெயில் E-mail - landcom@landcommdept.gov.lk   වෙබ් ලිපිනය / இணையம் Web Address - www.landcommdept.gov.lk

## I කොටස

### ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන රණවිරු බාණ්ඩ

2009.06.01 දිනට පෙර සේවයට බැඳී ඇති පදිංචියට ඉඩමක් නොමැති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ /නාවික හමුදාවේ/ගුවන් හමුදාවේ/ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් හා ඔවුන්ගෙන් යැපෙන්නන් මෙම රණවිරු ප්‍රතිලාභ යටතේ ආවරණය වේ.

### පළමු කාණ්ඩය

1. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතීන්ට (විවාහක නම් කලත්‍රයාට කලත්‍රයා නොමැති නම් අවිවාහක දරුවෙකුට /අවිවාහක නම් මව හෝ පියා)
2. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී අතුරුදන් වූ රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතීන්ට (විවාහක නම් කලත්‍රයාට කලත්‍රයා නොමැති නම් අවිවාහක දරුවෙකුට /අවිවාහක නම් මව හෝ පියා)
3. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන්ට

### දෙවන කාණ්ඩය

1. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන්ට
2. ක්‍රියාන්විත නොවන හේතුවක් මත මියගිය රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතීන්ට (විවාහක නම් කලත්‍රයාට කලත්‍රයා නොමැති නම් අවිවාහක දරුවෙකුට / අවිවාහක නම් මව හෝ පියා)
3. ක්‍රියාන්විත සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය රණවිරුවන්ට
4. දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන්ට

## II කොටස

### ප්‍රතිලාභ හිමිවන ආකාරය

(අ) ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන රණවිරු කාණ්ඩ අතුරින් I කොටසෙහි පළමු කාණ්ඩය යටතට අයත්වන රණවිරුවන් / ඔවුන්ගේ ළඟම ඥාතීන්ට රජයේ ඉඩම් ආඥා පනතේ 6 වගන්තිය අනුව ගාස්තු අයකිරීමෙන් තොරව දීමනා පත්‍රයක් ලබා දිය යුතුය. දීමනා පත්‍රය නිකුත් කරන තෙක් එම ඉඩමට විධිමත්ව ප්‍රවිශ්ඨ වීම සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදු අනුමැතියක් ලබා දිය යුතු බැවින්, ඒ සඳහා පහත දැක්වෙන නිර්දේශ වාර්තා පළාත් ඉඩම් කොමසාරිස් /අන්තර් පළාත් (ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්) මඟින් මා වෙත එවීමට කටයුතු කරන්න.

- ඉල්ලීම් ලිපිය
- 19 පරිශිෂ්ඨ වාර්තාව
- තත්ත්ව වාර්තාව
- බදු ගෙවන බවට දිවුරුම් ප්‍රකාශය
- 17 පරිශිෂ්ඨ වාර්තාව
- කච්චේරි අවසන් තේරීම් ලැයිස්තුව
- බදු ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ සහතික කල පිටපතක්.
- විවාහක රණවිරුවකු නම්, විවාහ සහතිකයේ සහතික කළ පිටපතක්.
- අවිවාහක රණවිරුවකු නම්, මෙහි කොන්දේසි ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශය විසින් නම් කරන ලද බදු ඉල්ලුම්කරුගේ ඥාතීත්වය තහවුරු කිරීමට අදාල ලේඛනවල සහතික කල පිටපත්

- අවසන් තේරීම් ලැයිස්තුවේ සහතික කල පිටපතක්.
- ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය
- පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය

එම දීර්ඝකාලීන බද්ද වර්ෂයකට රු. 1000.00 ක නාමික බදු මුදලක් යටතේ ලබා දෙන අතර බදුකරු ඉඩම සංවර්ධනය කර ස්ථිර ව පදිංචි වීමෙන් පසුව තවදුරටත් ගාස්තු අය කිරීමකින් තොරව දීමනා පත්‍රය ලබා දීම සඳහා නිර්දේශ වාර්තා මා වෙත එවිය යුතුය. එසේ එවන අවස්ථාවේදීම "ඹ" රේඛා චිත්‍රයක් ලබාගැනීම සඳහා මැනුම් ඉල්ලීම ද ජ්‍යෝෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කර එහි පිටපතක් ද මා වෙත එවිය යුතුය.

(ආ) ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන රණවිරු කාණ්ඩ අතුරින් ඉහත I කොටසෙහි දෙවන කාණ්ඩය යටතට අයත් රණවිරුවන් සඳහා පදිංචිය සඳහා ඉඩම් කොටසක් ලබා දීමේ දී ප්‍රථමයෙන් දීර්ඝකාලීන බදු අනුමැතියක් ලබා ගත යුතු වේ. ඒ සඳහා මෙහි II කොටසෙහි "(අ)" හි සඳහන් පරිදි නිර්දේශ වාර්තා මා වෙත එවීමට කටයුතු කරන්න. මෙම බදුකරුවන්ගෙන් අයකල යුතු වාර්ෂික බදු මුදල වන්නේ තෝරා ගත් වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 10% බදු මුදලෙන් 4% ක් වන අතර පහත කොන්දේසි සම්පූර්ණ කර ඇති බදුකරුවන් සඳහා නිදහස් දීමනා පත්‍රයක් ලබාදීමට කටයුතු කළ යුතු ය.

1. ඉඩම සංවර්ධනය කර ඉඩමේ පදිංචි වී සිටිය යුතුය.
2. ඉඩමේ නොදියුණු වටිනාකමින් 10% ක මුදල ගෙවා අවසන් වී තිබිය යුතුය.

ඒ අනුව, එම කොන්දේසි සපුරන බදුකරුවන් වෙත දීමනා පත්‍රය ලබාදීම සඳහා

1. දීමනා පත්‍රය සලකා බැලීමේ වාර්තාව
2. ඉල්ලීම් ලිපිය
3. තක්සේරු වාර්තාවේ සහතික කල පිටපතක්.
4. අයවිය යුතු තක්සේරු මුදල අයවී ඇති බවට ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය සහ ඊට අදාල රිසිට්පත්වල/බදු ලෙජරයේ සහතික කල පිටපත්
5. ඹ රේඛා චිත්‍රය ලබා ගැනීම සඳහා වූ මැනුම් ඉල්ලීමේ පිටපත

ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව පළාත් ඉඩම් කොමසාරිස් /අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් (ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්) මඟින් මා වෙත එවිය යුතුය.

(ඇ) <u>දැනටමත් බදු අනුමැතිය ලබා ගෙන ඇති / බදුකර නිකුත් කර ඇති රණවිරුවන් සඳහා සහන ලබා දීම</u>

මේ වන විටත් රජයේ ඉඩමක් දීර්ඝකාලීන බදු මත පදිංචිය සඳහා ලබා දීම සඳහා ගරු ඉඩම් අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති හෝ බදුකරයක් නිකුත් කර ඇති බදුකරුවන් ද, මෙහි I කොටසේ සඳහන් රණවිරු කාණ්ඩ යටතට අයත් වන්නේ නම්, එම රණවිරුවන් සඳහා ද මෙහි II කොටසේ (අ), (ආ) යටතේ හිමි රණවිරුවන්ට සහන ලබා දිය හැකිය. එම අවස්ථාවේ දී එම රණවිරුන්ට ලබා දී ඇති බදු අනුමැතිය සංශෝධනය කළ යුතු බැවින්, මෙහි III කොටසෙහි දක්වා ඇති පරිදි අදාල ආයතනයේ නිර්දේශය සමඟ ඔබගේ නිර්දේශය පළාත් ඉඩම් කොමසාරිස්

(අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්ගේ/ සහකාර ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ මඟින් එවීමට කටයුතු කරන්න.

(ඇ) රණවිරු දීමනාපත්‍රයේ කොන්දේසි සංශෝධනය කිරීම

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2005/3 හා 2016/7 චක්‍රලේඛ මඟින් හඳුන්වාදී ඇති ක්‍රමවේදය අනුව රණවිරු දීමනා පත්‍රවලට ඇතුලත් කර ඇති කොන්දේසිය මත දීමනාපත්‍රලාභීන් අපහසුතාවයට පත්වී ඇති බැවින්, එම කොන්දේසිය සංශෝධනය කිරීමට ද උක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. එබැවින්, ඉදිරියේ දී නිකුත් කිරීමට නියමිත රණවිරු දීමනාපත්‍රය සඳහා පහත සඳහන් කොන්දේසිය ඇතුලත් කිරීමට කටයුතු කරනු ලබයි.

"ඉඩම සඳහා විධිමත්ව තෝරා ගත් දිනයේ සිට වසර 05ක් යන තුරු මෙම ඉඩම මහ බැංකුවේ අනුමත බැංකු හෝ බැංකු නොවන මූල්‍ය ආයතනයකට උකස් කිරීම හා පවුලේ ආසන්නතම අයෙකුට පැවරීම හැර වෙනත් අන්සතු කිරීම හෝ අතුරු බඳු දීම් සිදු කළ නොහැක."

එසේ වුවද, දීමනා පත්‍රය ලබා දෙන අවස්ථාව වන විටත්, යම් බදුකරුවෙකු විධිමත්ව තෝරාගත් දින සිට වසර 05 ක් ගත වී ඇත්නම් කොන්දේසි විරහිත දීමනා පත්‍රයක් ලබා දීමට කටයුතු කරනු ලැබේ. එසේම, පූර්ව චක්‍රලේඛය යටතේ මේ වන විටත් නිකුත් කර ඇති ඇතැම් දීමනා පත්‍රවල කොන්දේසිය අනුව පවුලෙන් පරිබාහිර අයෙකුට පැවරීම කාල සීමා නියමකින් තොරව සීමා කර ඇති බැවින් එම දීමනා පත්‍ර සම්බන්ධයෙන් ද විධිමත්ව තෝරාගත් දින සිට වසර පහක් ගත වී තිබේ නම් එම දීමනා පත්‍රවල කොන්දේසිය ඉවත් කර කොන්දේසි විරහිත නව දීමනාපත්‍රයක් ලබාදීමේ හැකියාව පවතින බැවින්, එම දීමනා පත්‍රයේ කොන්දේසි සංශෝධනය කිරීම සඳහා පහත ලේඛන ඔබගේ නිර්දේශය සහිතව මා වෙත එවීමට කටයුතු කරන්න.

01. ඉල්ලීම් ලිපිය
02. මුල් දීමනා පත්‍රය හා කාර්යාලය පිටපත
03. දීමනා පත්‍රය රජයට භාරදීමේ එකඟතා ගිවිසුම

## III කොටස

ප්‍රතිලාභ හිමිකම සඳහා නිර්දේශ ලබා ගැනීම

මෙ යටතේ හිමිකම් ලබන අයදුම්කරුවන් තම ඉල්ලීමට අදාලව පහත පරිදි නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

I. ක්‍රියාත්විතයේ දී මියගිය/අතුරුදන්වූ සහ පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරු පවුල් සඳහා රණවිරු සේවා අධිකාරිය

II. සේවයෙන් විශ්‍රාම ගිය / සේවයේ යෙදී සිටින/ අනෙකුත් හේතූන් මත මියගිය හා ආබාධිත රණවිරුවන් සඳහා හමුදා මූලස්ථාන නිර්දේශ මත ආරක්ෂක අමාත්‍යාංශයේ සන්නද්ධ හමුදා සුභ සාධක අංශය

III. පොලිස් නිලධාරීන් - ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

IV. සිවිල් ආරක්ෂක නිලධාරී - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

## IV කොටස

### දීම සඳහා ඉඩම් තෝරා ගැනීම

I. ඉහත III කොටසේ සඳහන් ආයතන හරහා ප්‍රාදේශීය ලේකම් වෙත රණවිරු පදනම යටතේ ඉඩමක් ලබා දෙන ලෙස නිර්දේශයක් ලද විට දැනටමත් පදිංචි වීමට ඉඩමක් නොමැති බව තහවුරු කර සුදුසු ඉඩම් කොටසක් ලබා දීම සඳහා මාගේ 2008/4, 2008/4(1) හි උපදෙස් පරිදි කටයුතු කරන්න. ආරක්ෂක අමාත්‍යාංශය විසින් මූලික තේරීම් ලේඛණයක් ඉදිරිපත් කරන්නේ නම් එම ලේඛණය පාදක කර ගනිමින් ඉඩම් කච්චේරි සඳහා කැඳවා අවශ්‍ය ඉදිරි කටයුතු කළ යුතු වේ.

II. ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉහත 1 සිට 7 දක්වා සුදුසුකම් ලබන රණවිරුවන් දැනටමත් පදිංචිව සිටින ඉඩම් ද මෙයට අදාල කර ගත යුතු අතර ඒ සඳහා ද මාගේ චක්‍රලේඛ අංක 2008/4 හා 2008/4(1) අනුව විධිමත් තෝරා ගැනීමක් යටතේ ඉදිරි කටයුතු කළ යුතුය.

III. රණවිරුවන්ට ඉඩම් බෙදාදීම සඳහා ඉඩම් අවශ්‍ය ප්‍රදේශවලින් සුදුසු ඉඩම් හඳුනාගැනීමට හා ඉඩම් බෙදාදීමට ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අදාල යන ආයතන සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කළ යුතුය.

### විශේෂ කරුණු

1. මෙම ප්‍රතිලාභ යටතේ දීර්ඝකාලීන බදු ලබාගත් රණවිරුවෙකු හෝ ඔහුගේ පවුලේ යැපෙන්නන් විසින් මෙම ඉඩම බදු අනුමැතිය ලද දින සිට වසරක් තුල සංවර්ධනය කර පදිංචි විය යුතු අතර එසේ සිදු නොකරන රණවිරුවන්ට හිමි මෙම ප්‍රතිලාභ අවලංගු කිරීමට කටයුතු කළ යුතු අතර එවැනි අවස්ථාවකදී සාමාන්‍ය බදු ක්‍රමවේදය යටතේ එම බදුකරුවන්ගෙන් බදු මුදල අය කළ යුතුය. එවැනි අවස්ථාවන් නිරීක්ෂණය වූ වහාම බදු අනුමැතිය සංශෝධනය කිරීම සඳහා මා වෙත දන්වා එවීමට කටයුතු කරන්න.
2. 2009.06.01 දිනට පසුව සේවයට බැඳී ඇති රණවිරුවන් සඳහා සාමාන්‍ය බදු ක්‍රමය යටතේ රජයේ ඉඩමක් ලබාගැනීමට හිමිකමක් ඇති අතර එවැනි ඉල්ලීමක් ඉදිරිපත් වූ විට විධිමත් තෝරා ගැනීමකට ලක් කර දීර්ඝකාලීන බදු ලබාදීම සඳහා නිර්දේශ වාර්තා කඩිනමින් එවීමට කටයුතු කළ යුතුය.

මෙම චක්‍රලේඛය නිකුත්වීමත් සමඟ මේ සම්බන්ධයෙන් මෙ වන විට නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ අවලංගු වන අතර, මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී යම් ගැටළුවක් වේ නම් මා විමසන්න.

ජී.ඩී.කීර්ති ගමගේ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

| | |
|---|---|
| 01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය | - කා.දැ.ගැ.ස. |
| 02. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය | - කා.දැ.ගැ.ස. |
| 03. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස. |
| 04. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස. |
| 05. ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස. |
| 06. ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස. |
| 07. ත්‍රිවිධ හමුදාධිපතිවරුන් | - කා.දැ.ගැ.ස. |
| 08. පොලිස්පති | - කා.දැ.ගැ.ස |
| 09. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | - කා.දැ.ගැ.ස. |
| 10. දිස්ත්‍රික් ලේකම්වරුන් | - කා.දැ.ගැ.ස. |
| 11. සභාපති, රණවිරු සේවා අධිකාරිය | - කා.දැ.ගැ.ස. |

# ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් සඳහා රජයේ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය

- ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් වෙනුවෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021.02.09 දිනැති 2021/01 චක්‍රලේඛය අනුව පදිංචිය සඳහා සහනදායී ක්‍රමවේදයක් යටතේ රජයේ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතියක් ආරක්ෂක අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- මේ සඳහා 2009.06.01 දිනට පෙර සේවයට බැදී ඇති පදිංචියට ඉඩමක් නොමැති රණවිරුවන් හා ඔවුන්ගේ යැපෙන්නන් හට අයදුම් කළ හැකිය. ඒ අනුව ඉඩම් නොමැති රණවිරුවන්ට පදිංචිය සඳහා ඉඩමක් ලබාදීමත්, රජයේ ඉඩම් වල පදිංචි රණවිරුවන්ට ඉඩමේ තක්සේරු වටිනාකමින් 10%ක් පමණක් අය කර දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබා දීමත් සිදු කරන අතර අයදුම්පත් අදාළ හමුදාවේ/පොලිසියේ/ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සුභසාධක අංශ මගින් හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන්(www.defence.lk) ලබාගත හැකිය.

- 2021/01 චක්‍රලේඛය යටතේ ඉඩම්/ දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබා ගැනීමට අදාළ අයදුම්පත් සම්පූර්ණ කර අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව අංශය/ඒකකය/ කොට්ඨාසය/රෙජිමේන්තුව හරහා පහත සඳහන් කාණ්ඩ වලට අයත් රණවිරුවන් ඔවුන්ට අදාළ ආයතන වෙත යොමු කළ යුතුය.

  I. යුද්ධ හමුදාවේ සේවයේ නියුතු රණවිරුවන් - යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය
  II. යුද්ධ හමුදාවේ ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය, අර්ධ වශයෙන් ආබාධිත හා විශ්‍රාමික රණවිරුවන් - රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය
  III. නාවික හමුදාවේ සියලුම රණවිරුවන් - නාවික හමුදා සුභසාධක අංශය
  IV. ගුවන් හමුදාවේ සියලුම රණවිරුවන් - ගුවන් හමුදා සුභසාධක අංශය
  V. පොලිස් නිලධාරීන් - පොලිස් සුභසාධක කොට්ඨාසය
  VI. සිවිල් ආරක්ෂක නිලධාරීන් - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
  VII. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී මියගිය, අතුරුදහන් වූ සහ පූර්ණ ආබාධිත තත්වයට පත් ත්‍රිවිධ හමුදා රණවිරු පවුල් සඳහා - රණවිරු සේවා අධිකාරිය

- යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය, රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, නාවික හමුදා සුභසාධක අංශය හා ගුවන් හමුදා සුභසාධක අංශය මගින් නිර්දේශිත ඉඩම්/දීර්ඝකාලීන බදු බලපත්‍ර අයදුම්පත් ආරක්ෂක අමාත්‍යාංශයේ සන්නද්ධ හමුදා සුභසාධන අංශය වෙත යොමු කළ යුතුය.

- රණවිරු සේවා අධිකාරිය මගින් නිර්දේශ කරනු ලබන ඉඩම්/ දීර්ඝකාලීන බදු බලපත්‍ර අයදුම්පත් සෘජුවම අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමු කළ යුතු අතර පොලිස් දෙපාර්තමේන්තුව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කරනු ලබන දීර්ඝකාලීන බදු බලපත්‍ර අයදුම්පත් සෘජුවම අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතත් ඉඩම් අයදුම්පත් ආරක්ෂක අමාත්‍යාංශයේ සන්නද්ධ හමුදා සුභසාධන අංශය වෙතත් යොමු කළ යුතුය.

- එම නිර්දේශිත අයදුම්පත් ලැබීමෙන් පසු ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කච්චේරි පවත්වා ප්‍රතිලාභීන් තෝරා ගනු ලබන අතර එම ප්‍රතිලාභීන්ට මායිම් පෙන්වාදීම හා තාවකාලික හිමිකම් ලිපි ලබාදීම සිදු කරනු ලැබේ .